චක්‍රලේඛ අංක : 12/2023

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 ,
ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2023.12. 27

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

උසස් අධ්‍යාපන සුදුසුකම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දිරි දීමනා ගෙවීම.

සමූපකාර සේවකයින් විසින් පහත පරිදි අත්පත් කර ගන්නා උසස් අධ්‍යාපන සුදුසුකම් වෙනුවෙන් දැනට ගෙවනු ලබන දිරි දීමනා සංශෝධනය කිරීමට කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.ඒ අනුව කොමිෂන් සභාවේ අනුමත පත්වීමක් දරන සමූපකාර සේවකයකුට පහත විධිවිධාන වලට යටත්ව දීමනා ලබා ගැනීමට හැකියාව ඇත.

| | ලබා ගත යුතු සුදුසුකම් | එක් වරක් පමණක් ගෙවන දීමනාව | දීමනාවක් වශයෙන් ගෙවිය යුතු වැටුප් වර්ධක ගණන |
|---|---|---|---|
| | පශ්චාත් උපාධි සහතිකය | 5000.00 | 02 |
| | වරලත් ගණකාධිකරණය හා ඒ හා සමාන වෙනත් වෘත්තීය විභාග වල අවසන් සහතිකය | 5000.00 | 02 |
| | ගෞරව උපාධිය | 5000.00 | 02 |
| | සාමාන්‍ය උපාධිය හා ඒ හා සමාන සහතික | 2750.00 | 01 |
| | ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ ඩිප්ලෝමා | 2750.00 | 03 |
| | සමූපකාර සේවකයින්ගේ දැනුවත්භාවය වැඩිකරගැනීම සඳහා පහත 02 යටතේ දැක්වෙන ආයතනයකින් ලබා ගත් ඩිප්ලෝමා පාඨමාලා<br>• මාස 06 සිට වසර 01 දක්වා<br>• වසරක් හෝ ඊට වැඩි කාලය සඳහා | <br><br>2500.00<br>3000.00 | <br><br>01<br>01 |
| | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති විෂයානුබද්ධ පාඨමාලා | 3000.00 | 01 |
| | සමූපකාර උසස්පෙල (පූර්ණ සාමාර්ථය) | 2000.00 | 02 |
| | සමූපකාර සාමාන්‍ය පෙල (පූර්ණ සාමාර්ථය) | 1750.00 | 01 |

උපාධි සහතිකය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතනයක් විසින් නිකුත් කරන ලද්දක් විය යුතුය

02. ආයතන ලැයිස්තුව

I . ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
Ii . ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
Iii . ශ්‍රී ලංකා වරලත්කළමනාකරණ ගණකාධිකාරී ආයතනය
Iv . ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය
V . සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය

03. කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමේදී සමුපකාර සේවක කොමිෂන් සභා 01 ආකෘති පත්‍රය සමඟ පහත සඳහන් විස්තරද ඒ සමඟ ඉදිරිපත් කල යුතුය.

I. කොමිෂන් සභාවේ අනුමත පත්වීම් ලිපියේ පිටපත.

Ii. ලබා ඇති අධ්‍යාපනික /වෘත්තීය සුදුසුකම් පිලිබඳ සහතික වල සහතික කරන ලද පිටපත්.

iii. මෙම සුදුසුකම් තනතුරේ හා ආයතනයේ කාර්ය ඵලදායකත්වය කෙරෙහි දැනට හෝ ඉදිරියේදී බලපෑ හැකි අන්දම

iv. ප්‍රමානවත් මූල්‍ය ප්‍රතිපාදන තිබේද යන්න

v. අධ්‍යක්ෂක මණ්ඩල තීරණය

04. ඉහත වගුවේ " 3 " තීරුවේ සඳහන් වැටුප් වර්ධක මත ගෙවන දීමනාව මූලික වැටුපට එකතු නොකල යුතු අතර, එය දීමනාවක් ලෙස මාසික වැටුප සමඟ ගෙවිය යුතු වේ.ඉහත දැක්වෙන සුදුසුකම් යම් තනතුරකට බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස සලකා ඇත්නම් මෙම දීමනාව ලබා ගැනීමට හිමිකමක් නොමැත. දැනට ක්‍රියාත්මක චක්‍රලේඛ ප්‍රකාරව මේ වන විටත් උසස් අධ්‍යාපන සුදුසුකම් වෙනුවෙන් දිරි දීමනා ලබන නිළධාරීන්ට තවදුරටත් එම දීමනාව ලබා ගත හැකි වන්නේ එවැනි නිළධාරියෙකු දරන නිත්‍ය තනතුරට ඉහත සුදුසුකම බඳවාගැනීමේ පටිපාටිය ප්‍රකාරව මූලික සුදුසුකමක් නොවන්නේ නම් පමණක් වන අතර එම නිළධාරීන්ට මෙම චක්‍රලේඛ සංශෝධන අදාල කරගත නොහැක.

05. එහෙත්, උපාධිධාරී අභ්‍යාසලාභී යෝජනා ක්‍රමය යටතේ සමුපකාර සේවයට බඳවාගෙන ඇති කොමිෂන් සභා 3/2004 චක්‍රලේඛය ප්‍රකාරව දිරි දීමනා ලබමින් මේ වන විටත් සේවයේ නියුක්තව සිටින සේවකයින්ට පමණක් මෙම දීමනා තවදුරටත් ලබා ගැනීමට මෙම චක්‍රලේඛ විධිවිධාන බාධාවක් නොවේ.

06. තවද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් විසින් නිකුත් කරන ලද වෘත්තීය පාඨමාලා සහතික සඳහා දිරි දීමනා ගෙවීමට හැකියාව ඇති අතර, යම් සේවකයකු දැනට දිරි දීමනා ලබන තනතුරට වඩා ඉහල තනතුරකට දිරි දීමනා ඉල්ලුම් කරනු ලබන්නේ නම් ඔවුන්ට එම ඉහල තනතුරට අදාල මෙම චක්‍රලේඛයේ වැටුප් වර්ධක දීමනාව පමණක් ලබා ගැනීමට හැකියාව ඇත.

07. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන් 2024.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර උසස් අධ්‍යාපන සුදුසුකම් වෙනුවෙන් දිරි දීමනා ගෙවීමට නිකුත් කර ඇති අනෙකුත් චක්‍රලේඛ එදින සිට අවලංගු වේ.

කොමිෂන් සභා නියමය පරිදි,

එස්.ජේ.ජයසිංහ.
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් :
1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. ) - කා.දැ.ගැ.පි.
2. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.
3. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ /ගම්පහ /කළුතර) - කා.දැ.ගැ.පි.